සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

## ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. හෙබ්‍රෙව් බයිබල් පිටපත 'මැසරෙටික් පිටපත' ලෙසින් හැඳින්වීමට හේතු වුයේ,
    1. හෙබ්‍රෙව් මුල් පිටපත ව්‍යාංජන අක්ෂරවලින් ලියා තිබූ නිසා ය.
    2. හෙබ්‍රෙව් මුල් පිටපත ස්වර අකුරුවලින් ලියා තිබූ නිසා ය.
    3. ප්‍රාණාක්ෂර යෙදුවේ මැසරෙටික්වරුන් නිසා ය.
    4. මැසරෙටික්වරුන් විසින් ව්‍යාංජන අක්ෂර යෙදූ නිසා ය.
    5. හෙබ්‍රෙව් පිටපත සම්පූර්ණයෙන් ම ලියන ලද්දේ මැසරෙටික්වරුන් නිසා ය.

02. සාමුවෙල් විසින් ජනතාවට 'සාවුල් රජු' ලෙසින් හඳුන්වා දුන්නේ .............. හිදි ය. මෙහි හිස්තැනට සුදුසු පදය වන්නේ,
    1. මිස්පා 2. දාන් 3. බෙයර්ෂෙබා 4. ෂෙකෙම් 5. හෙබ්‍රොන්

03. ඉශ්‍රායෙල් ජනතාව සාමුවෙල්ගෙන් රාජකීය නායකත්වයක් ඉල්ලීමට හේතු වූ කරුණු පමණක් සහිත පිළිතුර තෝරන්න.
    A. දියුණු තාක්ෂණ ශිල්ප ක්‍රම භාවිත නොකිරීම B. සාමුවෙල් වයස්ගතව සිටීම.
    C. සාමුවෙල් පක්ෂපාති විනිශ්චයන් ලබාදීම. D. සාමුවෙල්ගේ පුත්‍රයන් අල්ලස් ගැනීම.
    E. දේශය එක්සේසත් කිරීමට නොහැකි වීම.
    1. A, B හා C ය. 2. B, C හා D ය. 3. C , D හා E ය.
    4. B , D හා E ය. 5. B , C හා E ය.

04. ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ඒමට කටයුතු කළ රජතුමා කවුද?
    1. සාවුල් රජතුමා 2. දාවිත් රජතුමා 3. සලමොන් රජතුමා
    4. ජොෂියා රජතුමා 5. ශෙදකියා රජතුම

05. රාජකාරී ක්‍රමය නිසා මිනිසුන් දැඩි හිංසාවට ලක්වූයේ කුමන රජුගේ යුගයේ ද?
    1. සලමොන් 2. දාවිත් 3. ජෙහොයාකිම්
    4. ජොහොයාකින් 5. ශෙදෙකියා

06. ජුදය, සමාරිය, ඉදුමිය පළාත් භාරව සිටි පස්වන ආණ්ඩුකාරයාගේ පරිපාලන මධ්‍යස්ථානය පිහිටා තිබුණේ,
    1. බෙතානියේ. 2. කොරාශිනයේ. 3. අරිමාතියේ.
    4. කයිසාරියේ. 5. බෙත්සයිදාවේ.

07. මැසරෙටික් පිටපත භාවිතා කරන්නේ ......................... හා .......................... ජනතාවයි. මෙහි හිස්තැනට සුදුසු පද වන්නේ,
    1. කතෝලික හා ක්‍රිස්තියානි 2. ජුදා හා ක්‍රිස්තියානි 3. ජුදා හා ප්‍රෙස්බෙටේරියන්
    4. කතෝලික හා ජුදා 5. ක්‍රිස්තියානි හා ප්‍රෙස්බෙටේරියන්

08. දෙවියන් වහන්සේ මිනිසුන් අතර 'සුපිරි' මිනිසෙක් ලෙස පෙන්වා දෙනු ලබන සම්ප්‍රදාය වන්නේ,
    1. යාවේ 2. එලෙහිම් 3. පූජක 4. වාචික 5. ද්විතීය නීති

09. ද්විතීය නීති සම්ප්‍රදාය තුළ නීතිය පිළිපැදීම හඳුන්වා ඇත්තේ,
1. වහල්භාවයක් ලෙස. 2. දේව වන්දනාවක් ලෙස. 3. අකීකරුවකමක් ලෙස.
4. විප්‍රවාසගතවීමක් ලෙස. 5. දේව ගරුබියක් ලෙස.

10. ප්‍රාග් ඉතිහාසය සම්පාදනය වීමට දායක වී ඇති සම්ප්‍රදායන් සහිත පිළිතුර තෝරන්න.
A. යාවේ සම්ප්‍රදාය B. එලොහිම් සම්ප්‍රදාය
C. පූජක සම්ප්‍රදාය D. ද්විතීය නීති සම්ප්‍රදාය
1. A හා D ය. 2. A හා B ය. 3. A හා C ය.
4. B හා D ය. 5. C හා D ය.

11. 'අපාර්' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,
1. වගා කිරීම. 2. දූවිල්ල 3. පොළව 4. මිනිසා 5. සාමය

12. මිනිසා සතු ආධිපත්‍ය පෙන්වන සලකුණ වන්නේ,
1. මිනිසා පසින් සෑදීමෙනි. 2. ජීවන හුස්ම ලැබීමයි.
3. ස්ත්‍රීයට නම් තැබීමයි. 4. ඒදන් උයනේ පදිංචි කරවීමෙනි.
5. සතුන්ට නම් තැබීමයි.

13. ජුදා ජනතාව බලාපොරොත්තු වූ මෙසියස් වහන්සේ සඳහා හේබ්‍රව් භාෂාවෙන් භාවිතා වන වචනය වන්නේ,
1. ක්‍රිස්ටොස්. 2. එම්මානුවෙල්. 3. මසියාහ්. 4. ෂාලොම්. 5. එළියා.

14. අනාගතයේ පැමිණෙන සාම රාජණන් පිළිබඳ කතා කරන දිවැසිවරයා වන්නේ,
1. එසකියෙල් 2. යෙසායා 3. මීකා 4. ජෙරමියා 5. හොෂියා

15. දාවිත් රජතුමාගේ උපන් ගම වන්නේ,
1. නාසරෙතය 2. දමස්කය 3. ජෙරුසලම 4. එප්‍රාතා 5. සමාරිය

16. ස්වාමීන් වහන්සේගේ සේවකයා පිළිබඳ උගන්වන පළමු ගීතය මේ නමින් හැඳින්වේ.
1. දාසයාගේ ගීතය 2. කාන්තාවගේ ගීතය 3. දරුවාගේ ගීතය
4. කුලීකරුවාගේ ගීතය 5. හාම්පුතාගේ ගීතය.

17. ''සමිදාණන් වහන්සේ උසස් කළ සේක'' යන අර්ථයෙන් නම් ලත් දිවැසිවරයා වන්නේ,
1. එසකියෙල් 2. මීකා 3. හොසියා 4. එළිෂා 5. ජෙරමියා

18. දර්ශන, උපමා හා සංකේත මගින් පණිවිඩ ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
1. එසකියෙල් 2. මීකා 3. හොසියා 4. ජෙරමියා 5. යෙසායා

19. ගීතාවලියේ කතෘත්වය ආරූඪ කර ඇත්තේ,
1. සලමොන් රජතුමාට 2. සාවුල් රජතුමාට 3. මෝසෙස්තුමාට
4. දිවැසිවර යෙසායාට 5. දාවිත් රජතුමාට

20. ගීතාවලියේ 'සේෆාර් තෙහෙලීම්' ලෙස හඳුන්වන්නේ,
1. ග්‍රීක භාෂාවෙනි. 2. ඉංග්‍රීසි භාෂාවෙනි. 3. හේබ්‍රෙව් භාෂාවෙනි.
4. ප්‍රංශ භාෂාවෙනි. 5. ලතින් භාෂාවෙනි.

21. ගීතාවලියේ රාජකීය ගීතිකා ලෙසින් හඳුන්වනු ලබන්නේ,
1. දාවිත් ගීතිකා. 2. මොසෙස්ගේ ගීතිකා. 3. කෝරාගේ ගීතිකා.
4. ආසාක්ගේ ගීතිකා. 5. සලමොන්ගේ ගීතිකා.

22. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පසල්තීනයේ පාලන බලය හිමි වුයේ,
1. ග්‍රීකවරුන්ට. 2. රෝමවරුන්ට. 3. හෙරෝදිවරුන්ට.
4. පිලිස්තිවරුන්ට. 5. ජුදාවරුන්ට.

23. මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව අනුව ආගමික ගැටළු විසඳනු ලැබුවේ.
1. සැන්හෙන්ඩ්‍රික් මන්ත්‍රණ සභාව මගිනි 2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව මගිනි.
3. දෙවන වතිකානු මන්ත්‍රණ සභාව මගිනි. 4. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව මගිනි.
5. එපීස මන්ත්‍රණ සභාව මගිනි.

24. 'සිනගෝගය' යන්නෙහි අරුත වන්නේ,
1. ජනතාවට ඉගැන්වීම. 2. ජනතාව සුව කිරීම. 3. ජනතාව එකතු කිරීම.
4. ජනතාව ආරක්ෂා කිරීම. 5. ජනතාව නඩත්තු කිරීම.

25. ප්‍රථමයෙන් ලියවුණු හා ඉතා කෙටිම සුබාරංචිය වන්නේ ........................ සුබාරංචියයි.
   1. ශු. මතෙව්   2. ශු. මාක්   3. ශු. ලූක්
   4. ශු. ජොහාන්   5. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා

26. මානව සංහතියට පොදු, ගැලවීම විශ්වීය සංකල්පයක් බව ඉදිරිපත් කරන කෘතිය වන්නේ,
   1. මතෙව් සුබාරංචිය   2. මාක් සුබාරංචිය   3. ලූක් සුබාරංචිය
   4. ජොහාන් සුබාරංචිය   5. ක්‍රියා පොත ය.

27. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා කර ඇත්තේ,
   1. ක්‍රි.ව. 63 - 70 අතර කාලයේ දී ය.   2. ක්‍රි.ව. 65 - 70 අතර කාලයේ දී ය.
   3. ක්‍රි.ව. 80 - 90 අතර කාලයේ දී ය.   4. ක්‍රි.ව. 85 - 90 අතර කාලයේ දී ය.
   5. ක්‍රි.ව. 90 - 100 අතර කාලයේ දී ය.

28. ලුස්ත්‍රාවේ දී 'සියුස්' ලෙස හැඳින්වූයේ,
   1. පාවුලුතුමාව.   2. බර්ණබස්තුමාව.   3. ජොහාන්මාක්ව.
   4. ජාකොබ්තුමාව.   5. පේදුරුතුමාව.

29. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ නායකත්වය උසුලන ලැබුවේ,
   1. පේදුරුතුමා.   2. පරිසිවනරුන්.   3. ජුදාවරුන්.
   4. සභාමූලිකයන්.   5. ජාකොබ්තුමා.

30. පාවුලුතුමාට හා සීලස්ට ලිදියා නම් ස්ත්‍රිය හමුවූයේ,
   1. තෙසලෝනිකයේ දී.   2. බෙරියාවේ දී.   3. පිලිප්පීයේ දී.
   4. ඇතැන්ස්හි දී.   5. කොරෙන්තියේ දී.

31. ප්‍රථම වතාවට ක්‍රිස්තියානි යන නමින් ශ්‍රාවකයන් හඳුන්වනු ලැබුවේ,
   1. සිරියාවේ අන්තියෝකියේ දී.   2. පාපස්හිදී.   3. පර්ගායේ දී.
   4. බෙරියාවේ දී.   5. එපීසයේ දී.

32. පාපස්හිදී සිදු වූ විශේෂ සිදු වීමක් වන්නේ,
   1. ජොහාන්මාක් ධර්මදූත චාරිකාවෙන් සමුගැනීම.
   2. පාවුලු හා බර්ණබස්ව දෙවිවරු ලෙසින් හැඳින්වීම.
   3. බර්ණබස් දර්බය වෙත හැරීයාම.
   4. ජෙරුසලම් මන්ත්‍රණ සභාව පිහිටුවීම.
   5. බාර් ජේසුස් අන්ධවීම.

33. මතෙව්තුමා පෙන්වා දෙන භාග්‍ය අට හඳුන්වන්නේ,
   1. සාරධර්ම සංග්‍රහයකි.   2. දේශනමාලාවකි.   3. ස්වර්ග රාජ්‍යයයි.
   4. කිතුනු දිවියේ සාක්ෂියයි.   5. බාර්ජේසුස් අන්ධවීමයි.

34. 'කොරියෝයි' යන ග්‍රීක පදයේ අර්ථය
   1. අලේප කළෝ ය.   2. සැනසීමදායක ය.   3. ප්‍රීති ප්‍රමෝද වන්න
   4. ස්ප්‍රීතුව ය.   5. ගැලවීමය.

35. මතෙව්තුමාගේ සුවිශේෂයට අනුව කිතුනු ජීවිතයේ කැඩපත වන්නේ,
   1. දස පනත.   2. ශුද්ධ වූ සභා පනත්.   3. ප්‍රසාද නිධාන.
   4. භාග්‍ය අට.   5. ශුද්ධාත්ම දීමනා.

36. දේව රාජ්‍යයේ උරුමකාරයන් වන්නේ,
   1. නිර්මල සිත් ඇත්තෝ ය.   2. බැගෑ සිතින් දෙව් සරණ පතන්නෝය.
   3. නිහතමානි ගුණ ඇත්තෝ ය.   4. ශෝක වන්නෝ ය.
   5. සිතින් සිළින්දෝ ය.

37. ලෝකය තුළ දේව රාජ්‍යය ගොඩ නැඟීමට ජේසුස් වහන්සේ කැඳවූ අය වන්නේ,
   1. බොහෝ අය, ධීවරයෝ ය.   2. බොහෝ අය, ගුරුවරු ය.
   3. බොහෝ අය, බදු අයකරන්නෝ ය.   4. බොහෝ අය, වෙළෙඳුන් ය.
   5. බොහෝ අය, අන්‍යජාතීන් ය.

38. 'අපොස්ටොලොස්' යන ග්‍රීක වචනයේ සිංහල අනුවාදය වන්නේ,
   1. වෙනත් අයෙකුගෙන් ඉගෙනුම ලබන තැනැත්තා   2. අපෝස්තුළුවරයා
   3. ගෝලයා   4. ශ්‍රාවකයා
   5. යවන ලද තැනැත්තා

39. දේව රාජ්‍ය පිළිබඳ සුබාරංචිය අපෝස්තුළුවරුන් විසින් පළමුව රැගෙන ගියේ,
   1. අන්‍යජාතීන් වෙත.   2. සමාරියන් වෙත.   3. එබ්‍රෙව්රුන් වෙත.
   4. ජුදෙව් ජනතාව වෙත.   5. පව්කරුවන් වෙත.

40. ධර්මදූත සේවය සඳහා දෙදෙනා බැගින් යා යුත්තේ ඇයි?
   1. තනියම නොයා යුතු නිසා ය.   2. මගදී අනතුරු සිදුවිය හැකි නිසා ය.
   3. සාක්ෂිකරුවන් වනු සඳහා ය.   4. සහයෝගය ඇතිව සේවය කළ යුතු නිසා ය.
   5. ප්‍රාතිහාර්ය කිරීමේ දී සහය අවශ්‍ය නිසා ය.

41. ධර්මදූත සේවයේ යෙදීමේ දී දෙවියන් වහන්සේගේ සුබාරංචි පණිවිඩ ප්‍රතික්ෂේප කරන අයවෙත වගකීම් පවරනු ලබන බව හඟවන සලකුණ වූයේ,
   1. ඔබට සාමය වේවා යි ප්‍රකාශ කිරීම ය.   2. ස්තුති ප්‍රශංසා වේවා යි කීම ය.
   3. ශාප ලද්දේවා යයි කීම ය.   4. සිප වැළඳ ගැනීමෙන් සමුගැන්ම ය.
   5. පාදවල දූවිලි ගසා දැමීම ය.

42. විශේෂ ඉගැන්වීමක් හඳුන්වා දුන් අවස්ථාවලදී ජේසුස් වහන්සේ භාවිතා කළ යෙදුමක් වන්නේ,
   1. සවන් ඇත්තෝ සවන් දෙත්වා !   2. ඔබ සමඟ වන සේක්වා !
   3. ඔබ ඔබම ප්‍රකාශ කරන සේක   4. මෙසේ පවසන සේක.
   5. මනුෂ්‍ය පුත්‍රයා වදාරණ සේක

43. පාවුලුතුමා විසින් ම ලියන ලද සංදේශ ලියවුණු කාලය අනුව ක්‍රි.ව. 65 - 67 කාලයට අයත් ලිපි සහිත පිළිතුර වන්නේ,
   1. 1, 2 තෙසලෝනික   2. 1, 2 කොරින්ති   3. එපීස, පිලමොන්
   4. ගලාති, රෝම   5. 1,2 තිමති

44. කොලොස්සිවරුන්ට ලියන ලද හසුනේ තේමාව වන්නේ,
   1. ක්‍රිස්තුන් වහන්සේ පරම ශ්‍රේෂ්ඨත්වය බවයි.
   2. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් දුක්විඳීම ප්‍රීතියක් බවය.
   3. ක්‍රිස්තුන් වහන්සේ සෑම කෙනෙකුම සමගි කරවන බවය.
   4. කිතුනුවෙකු වීමට ජාතිය නොවැදගත් බවයි.
   5. දුක්කරදර දරා ගැනීමට ක්‍රිස්තුන් වහන්සේ උදව් වන බවය.

45. ඊසාක් සිය මෙහෙකරුවන් සමඟ කණින ලද තුන්වන ළිඳට තබන ලද නම වන්නේ,
   1. ගෙරාර්.   2. ඒසෙක්.   3. සිත්නා.   4. රෙහෙබොත්.   5. නෙගෙබ්.

46. 'මච්සාහ්' යන හෙබ්‍රෙව් වදන හමුවන්නේ කුමන පිළිවෙත තුළද?
   1. තිත්තපලා අනුභවය   2. නුමුහුන් පුප සම්බන්ධ පිළිවෙත
   3. මිදි යුෂ පානය   4. පාස්කු බැටළුවා පිළිබඳ පිළිවෙත
   5. පවිත්‍රවීමේ පිළිවෙත

47. ගීතාවලියේ සඳහන් ගීතිකා ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම්වලට භාවිතා කර ඇති අවස්ථාවකි.
   1. සිමියොන්ගේ පැසසුම් ගීයේ දී   2. මරියාවන්ට මංගලම් කීමේ දී
   3. අන්‍ය රූප විලාශයේ දී   4. කුරුස ගසේ දී
   5. පරමණ්ඩල යාච්ඤාවේදී

48. සමරිතානුවරුන් ජේසුස් වහන්සේ පිළිගෙන කටයුතු කළ බවට උදාහරණයකි.
   1. දේවමාළිගාවේ වෙළඳුන් එළවා දැමීම.   2. ජාකොබ්ගේ ළිඳ ළඟ ස්ත්‍රියකගෙන් ජලය ඉල්ලීම.
   3. කානා නුවර ජලය මිදියුෂ බවට හැරවීම.   4. ලාසරස් මරණින් නැගිටුවීම.
   5. පව්කාර ස්ත්‍රියට ගල්ගැසීම.

49. ජුදා ජනතාව දේව නමස්කාරයට පෙර සිදු කළ සිරිතක් වන්නේ,
   1. වස්ත්‍ර සෝදා පවිත්‍ර වීම.   2. අත්පා සෝදා පවිත්‍ර වීම.
   3. දේවමාලිගාව ආශ්‍රයේ රැඳී සිටීම.   4. ස්ත්‍රී සේවනයෙන් වැළකීම.
   5. පාස්කු බැටළුවා පූජා කිරීම.

50. කිතුනු ජනවන්දනාවේ උතුම් ව අංගය වන්නේ,
   1. යාම යැදුම   2. ප්‍රසාද නිධාන   3. දිව්‍ය පූජාව
   4. දස පනත   5. දේවස්ථාන වාර්ෂික මංගල්‍ය

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ............................ ක්‍රිස්තු ධර්මය II කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. සමාරියාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිත වැදගත් ස්ථාන හතරක් ලියන්න.
    ii. පලස්තීනයේ පදිංචි වීමෙන් පසුව ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතයේ සිදු වූ සාධනීය වෙනස්කම් හතරක් ලියන්න.
    iii. නීතිවේදී එස්රාට පැවරී තිබූ කාර්යයන් හතරක් ලියන්න.
    iv. උත්පත්ති පොතේ සඳහන් මනුෂ්‍යයාගේ වැටීම හා එහි ප්‍රතිඵල විදහා පාන කතා හතරක් නම් කරන්න.
    v. මැවීමේ පළමු කතාව අනුව සෑම දවසකටම පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

02. i. පලස්තීන වැසියන්ගේ ආර්ථිකයට බලපෑ වෘත්තීන් හතරක් ලියන්න.
    ii. පාවුලුතුමා සමඟ තෙවන ධර්මදූත ගමනට සහභාගි වුවන් හතරදෙනෙකු නම් කරන්න.
    iii. පාවුලුතුමාගෙන් කිතුනුවන්ට ගත හැකි ආදර්ශ හතරක් ලියන්න.
    iv. පරිසිවරුන්ගේ ගති පැවතුම් අතර විශේෂයෙන් හඳුනාගත හැකි ලක්ෂණ හතරක් ලියන්න.
    v. පාවුලුතුමා අතින්ම ලියන ලද බව සැළෙකෙන ලිපි හතරක් නම් කරන්න. (ලකුණු 4 x 5 = 20)

03. i. කොරෙන්තිවරුන්ට ලියන ලද පළමු හසුන පිළිබඳ විශේෂ කරුණු හතරක් ලියන්න.
    ii. මතෙව්තුමා ඉදිරිපත් කරන දේශනා හතරක් නම් කරන්න.
    iii. දේව රාජ්‍යය පිළිබඳ කියවෙන උපමා හතරක් නම් කරන්න.
    iv. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රතිහාර්ය වර්ග හතර නම් කරන්න.
    v. සෑම දේශනයකම අවසානය පිළිබඳව මතෙව් තුමා ලබාදෙන ඉඟි දැක්වෙන ආකාර හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

## II කොටස

04. i. දිවැසිවර යෙසායා ඉදිරිපත් කරන ස්වාමින් වහන්සේගේ සේවකයාගේ ලක්ෂණ ගීත 04 ඇසුරින් විස්තර කරන්න.

ii. ''පුරාණ ගිවිසුමේත් නව ගිවිසුමෙත් පමණක් නොව වර්තමානයේත් ගීතාවලිය ජනවන්දනාවට හා යාච්ඤාව සඳහා නිධානයකි. '' මෙය වචන 100 කින් පමණ විමසන්න.

(ලකුණු 10 x 2 = 20)

05. i. අසිරියානු විප්‍රවාස සමයේ ඒකදේව වන්දනාවට එරෙහිව පැන නැගුණු අභියෝග 05 ක් විස්තර කරන්න.

ii. වත්මන් සමාජයේ මිනිසා අදේවවාදයට හා බහුදේව වාදයට නැඹුරුවීමට බලපා ඇති අර්බුධකාරී තත්තවයන් කරුනු 05 ක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 10 x 2 = 20)

06. i. 'දේව සැලැස්මට පිටුපා මිනිස් සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට යාම මිනිසාගේ විනාශයට හේතුවේ' බාබෙල් කොත පිළිබඳ කතාව ඇසුරින් ඉහත කියමන පැහැදිලි කරන්න.

ii. ශු.බයිබලයේ පරමාර්ථය මැවිල්ල සිදුවූ ආකාරය වාර්තා කිරීම නොව මැවිල්ලේ කතෘවරයාණන්, දෙවියන් වහන්සේ බව පසක් කිරීම හා මිනිසාගේ සර්වකාලීන ප්‍රශ්න කීපයකට පිළිතුරු දීමය. ප්‍රාග් ඉතිහාසය ඇසුරින් වචන 100 කින් පමණ විමසන්න. (ලකුණු 10 x 2 = 20)

07. i. කන්ද උඩ දේශනය යනු කුමක්ද? යන්න කරුණු 05 කින් පෙන්වා දී කන්ද උඩ දේශනය කිතුනු ඔබගේ ජීවිතයට නව අර්ථයන් දෙමින් එය යහපත් කර ගැනීමට පෙන්වා දෙන මාර්ගයක් බව පැහැදිලි කරන්න.

ii. ක්‍රිස්තුන් වහන්සේ තම අපෝස්තුළුවරුන් ධර්මදූත සේවය සඳහා සූදානම් කර යැවූ ආකාරය කෙටියෙන් පැහැදිලි කර තම ධර්මදූත කාර්යය කෙසේ විය යුතු දැයි කරුණු 05 කින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 2 = 20)

08. i. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන විස්තර සපයන්න.
(එක් මාතෘකාවකට වචන 100 ක් සැහේ)

i. පලස්තීනයේ විසූ ආගමික කණ්ඩායම් දෙකක් හඳුන්වන්න.

ii. ශු. ජොහාන් සුබාරංචියට ආවේණික ලක්ෂණ

iii. ජේසුස් වහන්සේගේ යුගාන්තය පිළිබඳ දේශනය

iv. ජෙරුසලමේ මන්ත්‍රණ සභාව

v. ශු. පාවුලු තුමාගේ ජීවිත පසුබිම හා සිත් හැරීම. (ලකුණු 10 x 2 = 20)

# තෙවන වාර පරීක්ෂණය - 2018
# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 12 ශ්‍රේණිය.
## I පත්‍රය
## පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| 1. 3 | 11. 2 | 21. 1 | 31. 1 | 41. 5 |
| 2. 1 | 12. 5 | 22. 2 | 32. 5 | 42. 1 |
| 3. 4 | 13. 3 | 23. 1 | 33. 1 | 43. 5 |
| 4. 2 | 14. 2 | 24. 3 | 34. 3 | 44. 1 |
| 5. 1 | 15. 4 | 25. 2 | 35. 4 | 45. 4 |
| 6. 4 | 16. 1 | 26. 3 | 36. 5 | 46. 2 |
| 7. 2 | 17. 5 | 27. 1 | 37. 1 | 47. 4 |
| 8. 1 | 18. 1 | 28. 2 | 38. 2 | 48. 2 |
| 9. 2 | 19. 5 | 29. 5 | 39. 4 | 49. 2 |
| 10.3 | 20. 3 | 30. 3 | 40. 3 | 50. 3 |

(ලකුණු 1X2=100)

# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 12 ශ්‍රේණිය.
## II පත්‍රය
### I කොටස

01. i. බෙතෙල්, ශිලෝ, ෂෙකෙම්, ගෙරසීම් කන්ද, දොතාන් (පිටු අංක 07)

ii. ස්ථාවර කෘෂිකාර්මික රටාවකට යොමුවීම.
වතුපිටි හිමිකර ගැනීම.
තාවකාලික කූඩාරම් වෙනුවට ස්ථිර නිවාස ගොඩනැගීම.
එවැනි දේ අගය කිරීම සඳහා අලංකාර කිරීම. (පිටු අංක 14)

iii. ව්‍යවස්ථාව කියවීම, විදේශිය භාර්යාවන් පිටමං කිරීම.
ගිවිසුම අලුත් කිරීම, සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම. (පිටු අංක 14)

iv. ආදම් ස්ව — නෝවා හා ජල ගැල්ම
කායින් ආබෙල් — බාබෙල් කොත (පිටු අංක 27)

v. දේව ආඥාව, දේව ආඥාව ඉෂ්ඨවීම, දේව මැවිල්ල අගය කිරීම, කාලය ගණන් කිරීම. (පිටු අංක 27)

02. i. වෙළදාම, ධීවර, ගොවි, එඬේරා (85)

ii. පාවුලු, සීලස්, තිමෝතියස්, බර්ණබස්, තීතස් (120)

iii. එඩිතරව සුබාරංචිය වෙනුවෙන් කැපවීම.
නිරතුරුව දේව කැමැත්ත සෙවීම.
ලෞකික දේ පිළිබඳව ආශා නොකිරීම. (123)
අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා වැඩ කිරීම. (123)

iv. මළවුන්ගෙන් නැගිටීම විශ්වාස කිරීම.
දාවිත්ගේ වංශයෙන් මෙසියස් පැමිණෙන බව විශ්වාස කිරීම.
ව්‍යවස්ථාව අකුරටම පිළිපැදීම.
ආගමික වත්පිළිවෙත්වල වැදගත්කම (89)

v. තෙසලෝනික, ගලානි, පිලිප්පි, කොරින්ති (125)

03. i. ශුද්ධාත්ම දීමනා තුළ සැබෑ ප්‍රේමය කරා ගමන් කළ යුතු බව.
නව ආරම්භයක් ඇති කළ බව ආදම් ක්‍රිස්තුන් වහන්සේ බව.
විවාහයේ ශුද්ධවන්ත බව රැකිය යුතු බව.
කිතුනු සභාව ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් බිහිවීම. (127)

ii. කන්ද උඩ දේශනය, ධර්මදූත සේවය පිළිබඳ දේශනය, උපමා පිළිබඳ දේශනය, යුගාන්තය පිළිබඳ දේශනය (134)

iii. නිධානය, මුතු ඇට, දාලා, කිරිදී පිළිබඳ උපමාව (137 - 138)

iv. ස්වභාවධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය, සුවකිරීම, දුෂ්ට ආත්ම දුරු කිරීම, මළවුන් උත්ථාන කිරීම.

v. ජේසුස් වහන්සේ මේ වචන කියා නිම වූ කල්හි.
ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස්දෙනාට උපදෙස් දී නිම කළ පසු
ජේසුස් වහන්සේ මේ උපමා කියා නිම කළ පසු
තවද ජේසුස් වහන්සේ මේ වචන වදාරා නිමකොට (134)

## II කොටස

04. i. **පළමුවන ගීතය (යෙසායා 42, 1-9)**
මෙය 'දාසයාගේ ගීතය' ලෙස හැඳින්වේ.)
දෙවියන් වහන්සේ සුවිශේෂ මෙහෙයකට සේවකයා තෝරා ඇත.
ඒ සඳහා ඔහුට දේවාත්මානුභාවය ලැබී ඇත.
සේවකයා තම කා්යය ඉටු කිරීමට හිංසාකාරී පියවර නොගනී. ජාතීන් උදෙසා මැදහත් වේ.
අධෛර්යයට පත් නොවී යුක්තිය ඉටුවන තුරු ඉවසිලිවන්තව කල කිරීමෙන් තොරව ක්‍රියා කරයි.
**දෙවන ගීතය (සෙයාසා 49 , 1 - 7)**
උපතට පෙර සිට සමිඳාණන් වහන්සේ මව් කුසයෙදීම සේවකයා තෝරා ගෙන ඇත.
ඉශ්‍රායෙල් ජාතියේ පුනරුත්ථාපනය සඳහා ඔහු දෙවියන් තුල යැපෙයි.
සියලු ජාතීන්ට ගැලවීම ගෙන ඒම ඔහුගේ කාර්යයයි.
දූත කාර්යයයෙහිදී දෙවියන් වහන්සේ ඔහුව ආරක්ෂා කරන සේක.
**තුන්වන ගීතය (යෙසායා 50, 4 - 11)**
සේවකයා වේදනා මැද දෙවියන් වහන්සේට ඇහුම්කන් දීමට කැමතිව කීකරුව සිටියි.
ප්‍රධාන කාර්යය දෙවිඳුන්ට විවෘත්ව සවන් දීමය.
එසේ සවන් දීමෙන් තමන් අනාවරණය කර ගත් වචනය තුලින් අප ගොඩනංවයි.
තමන් ප්‍රකාශ කරන වචන නිසා සේවකයා පීඩා විඳී සියල්ල ඉවසීමෙන් දරා ගනියි.
තම නිර්දෝෂ බව ප්‍රකාශ කර දෙවිඳුන්ට බාර කරයි.
ඔහු තුළ ගැඹුරු විශ්වාසයක් ඇත.
ඔහුට වද හිංසා පමුණුවන අය ඉදිරියේ නිහඬව සිට තමන්ව පරාජය කළ නොහැකි බව දෙවියන් තුළ විශ්වාස කරයි.
**හතරවන ගීතය (යෙසායා 52, 13 - 53,12)**
සේවකයා පිළිබඳ ප්‍රසිද්ද ගීතයයි.
සේවකයා මුහුණ දෙන ශාරීරික වද හිංසා සජීවීව විස්තර කරයි.
සේවකයා විඳින වේදනා නිසා විරූපීව අවලස්සන වී ප්‍රතික්ෂේප කරනු ලබයි.
පව්කරුවන් උදෙසා ඔහුගේ ශුද්ධ වූ ජීවිතය පූජා කරන නිසා දෙවිඳුන් ඔහුට ජයග්‍රහණය දෙන සේක.
පුරාණ ගිවිසුමෙහි සමාව ලබන පිණිස මිනිස් පූජාවක් කළ යුතු බව සඳහන්ව ඇත්තේ මෙහි පමණි.
පව් නසන පූජාව නිසා සේවකයා මහිමයට පත්වේ. (පිටු 72,73)

ii. පුරාණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ බලවත් මැදිහත් වීම් හේතුකොට ගෙන උන්වහන්සේට ප්‍රශංසා ගී නිර්මාණය කර ඇත.
ඊශ්‍රායෙල් ජනයා දෙවිඳුන් අත්දුටු බවට හොඳම සාක්ෂිය මෙයයි.
ජේසුස් වහන්සේද නව ගිවිසුම තුළදී ගීතාවලිය භාවියට ගෙන ඇත.
උදාඃ- කන්ද උඩ දේශනයේදී, කුරුස ගසේදී
වර්තමානයේදී ද අප ගීතාවලිය ඇසුරුකොට ගෙන යාච්ඤා කරමු.
ජනවන්දනාගේ උතුම්ම අංගය වූ දිව්‍ය පූජාවට ගීතාවලිය අත්‍යවශ්‍ය වේ.
එමෙන්ම යාම යැදුම සඳහාද ගීතාවලිය අනිවාර්ය අංගයකි. (පිටු 82,83) **(ලකුණු 4 x 5 = 20)**

05. i. උතුරේ වන්දනා ස්ථාන ලෙස බෙතෙල් හා දාන් ස්ථාපිත කරමින් ජනතාව ජෙරුසලම් දේව මන්දිරයට යාම වැළැක්වීම.
එම ස්ථාන දෙකෙහිම යාවේ දෙවියන් නියෝජනයට රන් වස්සන් දෙදෙනෙකු තැබීම.
රන්වනු රූප මගින් රූප වන්දනාව පැතිර යාම.
බාල් දේව වන්දනාව මගින් බහුදේව වන්දනා ඇති වීම.
නමස්කාර දින දර්ශන වෙනස් කිරීම.
ලෙවී ගෝත්‍රයෙන් පිටස්තර අය පූජකයන් ලෙෂ පත් කිරීම.
මිථ්‍යාදෘෂ්ටික අසිරියානු පදිංචිකරුවන් හා ඉශ්‍රායෙල් ජනයා අතර විවාහ හේතුවෙන් මිශ්‍ර සංකර ජනතාවක් බිහිවීම.
ඔවුන්ගේ නිජබිම්වලින් ගෙනා දෙවි දේවතාවන්ට වන්දනා මාන කිරීමට යොමු වීම නිසා මිශ්‍ර ආගම් අදහන්නන් 'සමරිතානුවරුන්'' බිහිවීම. (පිටුව 12)

ii. විද්‍යාව හා තාක්ෂණික දියුණුව
මූලධර්මවාදීන්ගේ බලපෑම්
බහු සංස්කෘතික බලපෑම්
බහු ආගමික පරිසරය
වේද භේදී තත්වියන්
ප්‍රශ්න ගැටළු වලට ක්ෂණික විසඳුම් සෙවීම.

06. i. ජනතාව තම කීර්තියට අහස උසට කොතක් ඇති නගරයක් තනයි.
පරමාර්ථය විසිර නොයාමයි.
දේව වාසභවනය අහස ලෙස සැලකූ බැවින් මෙය දෙවියන්ට හිමි ස්ථානය ගැනීමට යාමකි.
තමට හැකි නොහැකි දේ උඩගුව නිසා මිනිසාට නොතේරූ කළු ගල් වෙනුවට ගඩොල්, හුණු බදාම වෙනුවට කීල්තාර භාවිතයට මෝඩ ක්‍රියාවකි.
මිනිසාට මෙය විශාල කා්රයයකි දෙවියන්ට මෙය දූවිලි කැටයක් මෙන් නිසා ස්වර්ගයෙන් බැස ඒමටද, දෙවිඳුන්ට සිදුවේ. එය මිනිසා ගැන උපහාසයට කරුණකි.
උඩගුවේ ප්‍රතිඵලය භේද හට ගැනීමයි.
මිනිසුන් එකතු කරන භාෂාව වියවුලකට පත්වේ.
එකිනෙකා අතර සබඳතා කැඩී යයි.
මිනිසා අසරණ වේ එකිනෙකා විසර යයි.
පාපයේ විපාක මිනිසා පිට කඩා වැටේ. (පිටුව 40, 41)

ii. උත්පත්ති පළමු පරිච්ඡේද 11 හි අඩංගු වන්නේ ඓතිහාසික විද්‍යාත්මක කරුණු නොවේ. දේව ධාර්මික කරුණුය.
ධර්මයේ අරමුණ මිනිසා ගැලවීමයි.
විශ්වයේ ආරම්භය වාර්තා කිරීමට බයිබල් කතුවරයා විවිධ උපමාත්මක කතා පුවත් භාවිතා කර ඇත.
එය මිනිසාට තේරුම් ගැනීම සඳහාය.

එමගින් පැහැදිලි කිරීමට අපහසු දේව ධාර්මික සත්‍යතා පහසුවෙන් පැහැදිලි කර ඇත.
එබැවින් විද්‍යාත්මක දියුණුව ලද මිනිසා විද්‍යාත්මක ඇසින් නොව දේව ධාර්මික දෘෂ්ටිකෝණයෙන් ශු.බයිබලය දෙස බැලිය යුතුය.
එබැවින් ආදී වනමාසී දඩයක්කාරුගේ සිට ලෝකයේ අවසාන මිනිසා දක්වා ගැලවීම දායක පණිවිඩය එක ලෙසය.
මනුෂ්‍යා මැවීම හා එහි ප්‍රතිඵල විදහා දැක්වෙන කතා ඇසුරින් මිනිසාගේ සර්ව කාලීණ ප්‍රශ්න සඳහා දේව ධාර්මික පිළිතුරු දීමට බයිබල් කතුරවරයා උත්සහා දරා ඇත. (පිටු 26, 27) **(ලකුණු 4 x 5 = 20)**

07. i. කන්ද උඩ දේශනාව හෙවත් භාග්‍ය අට සාරධර්ම සංග්‍රහයකි.
ජනතාව දෙවිඳුන් වෙතත් තම යුතුකම් හා වගකීම් වෙතත් යොමු කරයි.
ගුණගරුක යහපත් දිවි පෙවතක ගුණාංග පැහැදිලි කරයි.
කිතුනුවයාගේ ජීවිතයේ කැපත වෙයි.
දේව රාජ්‍ය උරුම කර ගත හැකි ආර්ය අෂ්ඨාංගික මාර්ගයකි.
පැරණි ගිවිසුම තුළ ජනතාවට මාර්ගෝපදේශය වූයේ දස පණතය. ක්‍රිස්තුන් වහන්සේ එම පනත් වලට නව අර්ථයන් දෙමින් කිතුනු ජීවිතය යහපත් කර ගන්නට කන්ද උඩ දේශනය හෙවත් (භාග්‍ය අට) මාර්ගයක් බව පෙන්වා දුන් සේක.
මෙහි සරල විධාන, අනතුරු ඇඟවීම්, හිතෝපදේශ හා පඬි වදන්, උප හැරණ, අනාවැකි, ආදියෙන් අලංකාර කර ඇත.
මේ තුළ දිවිගෙවන කිතුනුවා ශුද්ධවන්ත මඟකට පිවිසෙයි.
ජේසුස් වහන්සේ අනුගාමී වන්නටත් සදාචාරාත්මක හා ශීලධර්මානුබුල දිවි පැවැත්මක් අනුගමනය කරන්නට මඟ පෙන්වයි.
ජීවත්වන හැම අයෙකුගේම අරමුණ භාග්‍යවන්තයෙකු වීමය. සාමාන්‍ය ජීවිතයේ භාග්‍යයට වඩා කිතුනු ජීවිතයේ භාග්‍ය වෙතත් ජීවිතයක් බව කන්ද උඩ දේශනයෙන් පෙන්වා දෙයි.
දිළිඳුකම, ශෝකය, නිහතමානීකම, යුක්තය, දයාව, පිරිසිදු සිත, සාමය හා යුක්තිය උදෙසා පීඩා විඳීම වැනි ගුණාංග තුලින් වාසනාව උදාකර ගත හැකි බව අවධාරණය කරයි.
(සිසුන් ලියා ඇති කරුණු සළකා බලා ලකුණු ලබා දෙන්න.) (පිටු 134, 135)

ii. ජේසුස් වහන්සේ තම අපෝස්තුළුවරුන් තෝරා ගත්තේ යවන ලද තැනැත්තා යන අදහස ඇතිවය.
උන්වහන්සේ දොළොස් දෙනෙකු මේ කාර්ය සඳහා තෝරා ගත් සේක.
මොවුන් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය, මරණය. හා උත්ථානය සියැසින් දුටු සාක්ෂිකරුවෝ වූහ.
උන්වහන්සේගේ බලයලත් නියෝජිත පිරිසක් වූහ.
දේශනා කිරීමට, සුව කිරීමට, මළවුන් උත්ථානය කිරීමට හා යක්ෂයන් දුරු කිරිමට උන්වහන්සේ අපෝස්තුළුවරුන් පිටත්කර යවන සේක.
දේව රාජ්‍ය පිළිබඳ සුබාරංචිය රැගෙන ගිය පිරිසක්ය.
ඔවුන් දිව්‍ය සංරක්ෂණය මත යැපිය යුතුය.
සරල ජීවත පැවැත්මක් තිබූ අය වූහ.
සාමයේ පණිවිඩය ජනතාව අතර ගෙන යනු ලැබුවේ ඔවුන් ගත කළ පරිත්‍යාගි ජීවිතය තුළය.
එනම් වග වලසුන් අතරට බැටළුවන් යන්නාක් මෙනි.
ධර්මදූත සේවයේදී දෙදෙනෙකු බැගින් යැම සාක්ෂිකරුවන් වනු පිණිසය.
සාමය පැතීම ජුදෙව් සම්ප්‍රදායික ක්‍රමයක් බව.
ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න..... (ඉහත කරුණු ඇතුළත්ව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.) (පිටුව 136)

08. i. පරිසිවරු **විනයධරයන්.**
සෑම පරිසිවරයෙක්ම විනයධරයෙක් නොවේ.
විනයධරන්ගෙන් බහුතරය පරිසිවරුන්ය.
'පරිසි' අර්ථය වෙන්ව සිටීම.
අන්‍ය ජාතීන්, පව්කරුවන්, සමරිකානුවන්, අයකැමියන්, සාමාන්‍ය දුප්පත් ජනතාව හා ව්‍යවස්ථාව පිලිපැදීම පිළිබඳ උනන්දුවක් නොදැක්වූ පරිසගෙන් වෙන්ම ජීත් වූහ.
ජුදා සමාජයේ නීති රීති සම්පාදනයට කටයුතු කළේ විනයධරයන්ය. නීතිය ලියා තැබීම. එය අර්ථකථනය කිරීම, ආරක්ෂා කිරිම, ඒවාට අටුවාවන් සැපයීම, ඔවුන්ගේ ප්‍රධාන කාර්යයන්. (පිටු 88, 89)

**සද්දුසිවරු**
ශාදොක් පූජකයාගෙන් පැවත එනු ලබයි.
ධනවතුන්ය.
උත්තම පූජකයා වූයේ සද්දුසිවරුන් අතරින් එක් අයෙකි.
ජුදා ආගමික බල ව්‍යුහයේ ආධිපත්‍ය හෙබ වූ අයය.
ආගමික වත් පිළිවෙත් ඉටු කිරීමට දේව මාලිගාව සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය විය. (පිටු 90)

**සෙලට්වරු**
නිර්මාතෘ ගලීලයේ ජුදස්ය.
තම රට පාලනය කළ රෝම හමුදාවට විරුද්ධව ක්‍රියාකර විප්ලවාවදීන් ලෙස කටයුතු කළහ.
මෙසිස්ගේ පැමිණීම බලාපොරොත්තු වූයේ රෝම පාලනය බිඳ දැමීමටය.
ඔවුන්ගේ සටන දෙවියන් වහන්සේ හා ජනතාව වෙනුවෙනි. (පිටු 90)

**එසේනිවරු**
ජුදස් මකබියස්ගේ සහෝදර ජෙනාතන් උත්තම පූජක තනතුරට පත් වීමට විරෝධය පළ කරමින් කන්ඩායමක් මළ මුහුද අසල ගුහා වල පදිංචි විය. ඔවුන් එසේනිවරුය.
මොවුන් ගැන බයිබලයේ සඳහන් නැත.
ජුදා ආගමෙහි දෙවනි වන්නේ පරිසිවරුන්ට හා සද්දූවරුන්ට පමණි. (පිටු 90, 91)

ii. ජේසුස් වහන්සේ කවරෙක්ද යන්න සනාථ කිරීමට දැඩිව උත්සාහ කර ඇත. (ස්වයං අනාවරණය ප්‍රකාශන)
ජුදා සංදර්භයකට ආමන්ත්‍රණය කරයි.
ගැඹුරු දේවධාර්මික පදනමක් මත සුබාරංචිය ගොඩ නඟා ඇත.
ප්‍රාතිහාර්යයන් ජොහාන් තුමා ලකුණු ලෙෂ ඉදිරිපත් කරයි.

'මම වෙමි' ප්‍රකාශන (පිටු 103)
(මෙම කරුණු විස්තර කර ඇතනම් ලකුණු ලබා දෙන්න.)

iii. යුගාන්තය පිළිබඳ දේශනය අවසාන කාලයේ ස්වභාවය පිළිබඳ උපමා 07 කි.
අත්තික්කා ගස
කෙතෙහි වූ මනුෂ්‍යයන් දෙදෙනා
ස්ත්‍රීන් දෙදෙනා
විශ්වාසී හා අවිශ්වාසී දාසයෝ
යුවතියන් දස දෙනා
එළුවන්ගේ බැටළුවන් වෙන් කිරීම.
ජාතීන්ගේ විනිශ්චය දවස පිළිබඳ උපමාවෙන් අවසාන දේශනාව නිමවෙයි. එනම් ආත්මික හා ශාරීරය පුන්‍ය ක්‍රියා මතය .... (අවසාන උපමා 04 න් (පිටු 139,140) ලැබෙන පණිවිඩයද සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

iv. ක්‍රි.ව. 50 දී ජෙරුසලමේ පවත්වන ලදී.
පේදුරුතුමා, ජාකොබ්තුමා, පාවුලු තුමා, බර්ණබස් තුමා ඇතුළු ප්‍රේරිතයින් හා සභා මූලිකයින්, ජුදවාදීන් හා පරිසිරවරු මෙය රැස්විය.
නායකයා ජාකොබ්තුමාය.
සභාවට එක්වන විජාතීන් ගැලවීම ලැබීම සඳහා චර්මඡේදක පිළිවෙත ඉටු කළ යුතු ද යන ගැටළුව වෙනුවෙන් මෙය කැඳවීය.
දීර්ඝ විවාද, තර්කවිතර්ක මධ්‍යයේ පේදුරුතුමා සභාව ඇමතීම.
නිගමය විජාතීන්ට හිරුහැර කිරීම නතර කිරීම.
විජාතීන්ට සංදේශයක් මගින් නිගමනය දැනුම් දීම.
රූප සබම්න්ධ දූෂණකම් වලින් වැළකීඹ.
කාම මිත්‍යාචාරයෙන් වැළකීම.
බොටුව මිරිකා මැරූ ෂතුන්ගේ මස් කෑමෙන් වැළකීම.
ලෙයින් වැළකීම.
මෙම මන්ත්‍රණ සභාවෙන් ප්‍රශ්න, ගැටළු හා අභියෝග මධ්‍යයේ නොසැලී එකමුතුව එම අභියෝගවලට මුහුණ දෙමින් සාකච්ඡාවෙන් ගැටළු නිරාකරණය කර ගැනීම හා නිරතුරු ශුද්ධාත්මක මග පෙන්වීම තුළ නිවැරදි තීරණ ගැනීමට උත්සුක වීම යන ආදර්ශ කිතුනුවන්ට ලැබේ. (පිටුව 116,117)

v. ශු.පාවුලුතුමා ක්‍රි.ව. 5 - 10 කාලයේ සිලියාවේ තාර්සස් නුවර උපත ලැබීම.
බෙන්ජමින් ගෝත්‍රයට අයත්ය.
සාවුල් / පාවුළු යන නම් දෙකම භාවිත විය.
ගමාලියෙල් යටතේ අධ්‍යාපනය ලැබීම.
පියා නිසා රෝම පුරවැසිභාවයද ලැබීය. එය එතුමාට වරප්‍රසාදයක් විය.
ඇරමයික් හා ග්‍රීක බස කථා කළේය.
සිය පවුලේ ආභාසයෙන් කූඩාරම් කර්මාන්තය ප්‍රගුණ කළ අයෙකි.
දැඩි ජුදා ආගමික මතදාරියෙකු වූ එතුමා තම දහම සුරැකීමට පසුබට නොවීය.
දිනක් කිතුනුවන් මර්ධනයට ජෙරුසලමේ සිට දමස්කය බලා යමින් සිටි පාවුලු තුමා උත්මාන වූ ස්වාමින් වහන්සේ ව අත්දැකිනු ලබයි. එතැන් පටන් සභා පීඩකයකු සභා පෝෂකයෙකු බවට පරිවර්ථනය වෙමින් ජේසුස් වහන්සේ වෙනුවෙන් අපරාජිත ධර්මදූත මෙහෙවරයා එතුමා යෙදෙන ලදී.
පාවුලු තුමාගේ කැඳවීම වූයේ ජේසුස් වහන්සේගේ නාමය, විජතීන්ද, රජුන්ද, ඊශ්‍රයෙල් පුත්‍රයන්ද වෙත ගෙන යාමට ජේසුස් වහන්සේට තෝරාගත් භාජනයක් ලෙස ක්‍රියා කිරීමයි.
අනනියස්ගෙන් ප්‍රසාද ස්නාපනය ලැබීය.
පසුව ජීවිත තර්ජන මධ්‍යයේ නොබියව කිතු දහම ලොව පුරා පත කිරීමේ දේව අභිප්‍රායට උරදීමට එතුමාට හැකිවිය. එබැවින් එතුමා විජාතීන්ගේ අපෝස්තුළුවරයාය. (පිටු 110, 111,112)